කාර්යසාධන වාර්තාව
நிதிச் செயலாற்றுகைக் கூற்று
PERFORMANCE REPORT

2025

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
முகாமைத்துவ சேவைகள் திணைக்களம்
DEPARTMENT OF MANAGEMENT SERVICES

වැය ශීර්ෂ අංකය 242
செலவினத் தலைப்பு இல 242
Expenditure Head No 242

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
Ministry of Finance, Planning and Economic Development

2025 වර්ෂය සඳහා

වාර්ෂික කාර්යසාධන වාර්තාව

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංකය 242

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය 242

පටුන

පරිච්ඡේදය		පිටු අංකය
01: ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය		
1.1	හැඳින්වීම	1
1.2	ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු	2
1.3	දෙපාර්තමේන්තුවේ කාර්යයන්	
	1.3.1 ප්‍රධාන කාර්යයන්	3
	1.3.2 වෙනත් කාර්යයන්	4
	1.3.3 පාලන හා මූල්‍ය කටයුතු	4
1.4	සංවිධාන සටහන	5
1.5	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ	6
1.6	දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන/අරමුදල්	6
1.7	විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේනම්)	6
02: ප්‍රගතිය හා ඉදිරි දැක්ම		
2.1	2025 වර්ෂය තුල සිදු කරන ලද ප්‍රධාන කාර්යයන්	7
2.2	ජයග්‍රහණ	8
2.3	අභියෝග	8
2.4	ඉදිරි ඉලක්ක	8
03: 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය		
3.1	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	9
3.2	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	10
3.3	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	11

3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	12
3.5	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	13
3.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	13
3.7	මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	13
3.8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	14
3.9	විගණකාධිපතිවරයාගේ වාර්තාව (ඇමුණුම - 1)	

04: කාර්ය සාධන දර්ශක

4.1	ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	15

05: තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1	හඳුනාගන්නා ලද අදාල තිරසර සංවර්ධන අරමුණු	16 - 17
5.2	තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	18

06: මානව සම්පත් පැතිකඩ

6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	18
6.2	ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි අනුමත සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු මඟින් ඇති කරන බලපෑම	19
6.3	මානව සම්පත් සංවර්ධනය	19 - 23

07: අනුකූලතා වාර්තාව 24 - 31

01 වන පරිච්ඡේදය - ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රතිව්‍යුහගතකරණය යටතේ අතිරික්ත කාර්යමණ්ඩල අඩුකිරීම, අනවශ්‍ය අංශ ඒකාබද්ධ කිරීම හෝ වසා දැමීම ආදි පරිපාලන ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද ජාතික පරිපාලන ප්‍රතිසංස්කරණ සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ අනුව, 1998.08.14 දිනැතිව ''මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය ප්‍රතිසංවිධානය කිරීම'' යන මැයෙන් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයේ ''සේවක සංඛ්‍යා සහ වැටුප් කළමනාකරණ දෙපාර්තමේන්තුව'' නමින් නව දෙපාර්තමේන්තුවක් පිහිටුවීමට යෝජනා කර ඇත. 1998 අගෝස්තු මස 19 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි, 1998.11.27 වන දින සේවක සංඛ්‍යා සහ වැටුප් කළමනාකරණ දෙපාර්තමේන්තුව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතේ භාණ්ඩාගාරයට අයත් දෙපාර්තමේන්තුවක් ලෙස පිහිටුවන ලදි.

ඒ අනුව 1999.03.23 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ පරිදි අමාත්‍ය මණ්ඩලය විසින් 1999.04.09 වන දින කරන ලද විධානයන් (යොමු අංකය - සීපී/99/0492/03/030) අනුව ජාතික පරිපාලන ප්‍රතිසංස්කරණ සභාවේ තීරණ ක්‍රියාවට නංවන දෙපාර්තමේන්තුවක් ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත.

1999.04.09 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි, මහා භාණ්ඩාගාරයේ හා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් විසින් 1999.05.05 දිනැතිව කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක - 01 නිකුත් කරමින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීම නිල වශයෙන් දැනුම් දී ඇත.

තිරසාර සංවර්ධනයට දායක වීමේ අරමුණෙන් මෙම දෙපාර්තමේන්තුව විස්තීර්ණ සේවක සංඛ්‍යා සහ පාරිශ්‍රමික කළමනාකරණ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම පිණිස අනෙකුත් රාජ්‍ය ආයතන සමග එක්ව කටයුතු කරනු ලැබේ.

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත ව්‍යවස්ථාගත වීමත් සමග රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා හා පාරිශ්‍රමික කළමනාකරණය සම්බන්ධ නීතිමය ව්‍යුහය තවදුරටත් ශක්තිමත් වී ඇත. එම පනතේ විධිවිධාන වලට අනුව රාජ්‍ය අස්ථිත්වයන්හි සේවක සංඛ්‍යා හා පාරිශ්‍රමික කළමනාකරණය හා සම්බන්ධ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමතයට යටත්ව මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයාගේ විෂය පථය යටතේ රෙගුලාසි හා නියාමානුකිරීම් වලට යටත්ව එම බලතල ක්‍රියාවට නංවනු ලැබේ.

1.2 දැක්ම

කාර්යක්ෂමතාව, ඵලදායිතාව සහ තිරසාර සංවර්ධනය සහතික කරමින් ජාතික ප්‍රතිපත්ති සමඟ පෙළගැසෙන රාජ්‍ය අංශයේ ප්‍රශස්ත ශ්‍රම බලකායක් ඇතිකිරීම.

1.2 මෙහෙවර

සාධාරණ හා විනිවිදභාවයකින් යුතුව රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාව සහ පාරිශ්‍රමික කළමනාකරණය සඳහා මාර්ගෝපදේශ සැපයීම.

1.2 අරමුණු

i. සේවක සංඛ්‍යා සහ පාරිශ්‍රමික කළමනාකරණය

ii. රාජ්‍ය අංශයේ ආයතනවල සේවක සංඛ්‍යාවන් පිළිබඳ දත්ත පද්ධතිය යාවත්කාලීන කර පවත්වාගෙන යාම

iii. සේවා අවශ්‍යතාව අනුව අතිරික්ත සේවක සංඛ්‍යාව ප්‍රතිනියුක්ත කිරීම හෝ අඩු කිරීම

1.3 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ කාර්යයන්

1.3.1 ප්‍රධාන කාර්යයන්

- රාජ්‍ය අංශයට ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම සහ එම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම හා අධීක්ෂණය කිරීම.
- මෙහෙවර, පරමාර්ථ, විධික්‍රම, ක්‍රියාපටිපාටි සහ කාර්ය මණ්ඩල සම්පාදනය පිළිබඳව ආයතනික සමාලෝචන සිදු කර අදාළ ආයතන වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම .
- ආයතනික සේවක සංඛ්‍යා සමාලෝචනය කිරීම, විධික්‍රම වැඩිදියුණු කිරීම, රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමේ සහ කාර්ය මණ්ඩලය ප්‍රශස්ත මට්ටමට ගැනීමේ අරමුණෙන් ආයතනික ව්‍යුහ සකස් කිරීම සහ ශක්තිමත් කිරීම.
- සේවක සංඛ්‍යා සහ පාරිශ්‍රමික කළමනාකරණය පිළිබඳ ප්‍රතිමාන සහ ප්‍රමිති සකස් කිරීම.
- රාජ්‍ය සංස්ථා/ මණ්ඩල හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි කාර්යමණ්ඩල බඳවා ගැනීම් හා උසස් කිරීම් පරිපාටි අනුමත කිරීම් තුළින් ප්‍රමිතිගත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.
- සේවා ව්‍යවස්ථා, සේවා කොන්දේසි, බඳවා ගැනීමේ පටිපාටි සමාලෝචනය පිළිබඳ අධ්‍යයන සිදු කිරීම සහ ඒවා සංවර්ධනය කිරීමට ඇති හැකියාවට අදාළව යෝජනා ඉදිරිපත් කිරීම.
- අතිරික්ත සේවක සංඛ්‍යාවන් හඳුනාගෙන ඔවුන් සේවයෙහි නියුක්ත කිරීම සහ/හෝ අඩුකිරීම සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය අංශයේ සහ පළාත් රාජ්‍ය සේවයේ සේවක පිරිස පිළිබඳ තොරතුරු පද්ධතිය පවත්වාගෙන යාම සහ අත්‍යවශ්‍ය තනතුරු සඳහා අනුප්‍රාප්තික සැලසුම්කරණය.
- බඳවා ගැනීමේ ප්‍රතිපත්ති, හැකියා වර්ධනය සහ අනුප්‍රාප්තික සැලසුම්කරණය පිළිබඳ අධ්‍යයන සිදු කිරීම මෙන්ම ඒවා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී අදාළ බලධාරීන්ට සහාය වීම.
- ආයතනික සමාලෝචන, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, විශේෂ වියදම් ඒකක සහ පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල සේවක සංඛ්‍යා සහ වැටුප් කළමනාකරණයට අදාළ උපදේශන සේවා සැපයීම.
- වැටුප් සහ දීමනා ඇතුළුව රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාව පිළිබඳ වාර්තාව අවශ්‍ය අවස්ථාවන්හිදී අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනවල දිරි දීමනා ක්‍රම කළමනාකරණය.

1.3.2 වෙනත් කාර්යයන්

- පාර්ලිමේන්තුවේ අනුකාරක සභාවන් වන රාජ්‍ය ගිණුම් කාරක සභාවේ (COPA) සහ රාජ්‍ය ව්‍යාපාර කාරක සභා(COPE) රැස්වීම් අවස්ථාවලදී භාණ්ඩාගාරය නියෝජනය කරමින් ඒවාට සහාය දැක්වීම.

- අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබදව නිරීක්ෂණ සැපයීම.

- පාර්ලිමේන්තු කාරක සභාවල දී සහ අතිගරු ජනාධිපතිතුමා,ගරු අග්‍රාමාත්‍යතුමා විසින් කැදවන රැස්වීම්වල දී භාණ්ඩාගාරය නියෝජනය කිරීම.

1.3.3 පාලන හා මූල්‍ය අංශ කටයුතු

මානව සම්පත්, වත්කම් හා මූල්‍ය කළමනාකරණය සදහා පාලන හා මූල්‍ය අංශ වගකීම දරනු ලැබේ. ඒ අනුව, දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ පත්වීම්, උසස්වීම්, ස්ථානමාරු වලට අදාල කටයුතු, ධාරිතා සංවර්ධනයට අදාල කටයුතු හා සුභසාධන කටයුතු මානව සම්පත් කළමනාකරණයට ඇතුළත් වන අතර, භෞතික හා මූල්‍ය සම්පත් අත්පත් කර ගැනීම, නඩත්තු කිරීම හා වාර්තා පවත්වා ගැනීම භෞතික හා මූල්‍ය සම්පත් කළමනාකරණය යටතේ ආවරණයවේ.

මීට අමතරව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම, කාර්යසාධන වාර්තා, වාර්ෂික මූල්‍ය වාර්තා සැකසීම හා විගණන ගැටලු සම්බන්ධ පසුවිපරම් කටයුතු පාලන හා මූල්‍ය අංශයේ විෂය පථයට අයත්වේ.

1.4 සංවිධාන සටහන - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව



1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

I. ප්‍රතිපත්ති අංශය

II. කාර්යමණ්ඩල කළමනාකරණ අංශය

III. බඳවා ගැනීමේ පටිපාටි සකස්කිරීමේ අංශය

IV. වැටුප් අංශය

V. අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීමේ අංශය

VI. තොරතුරු කළමනාකරණ අංශය

VII. තොරතුරු දැනගැනීමේ පනත සම්බන්ධව කටයුතු කිරීමේ අංශය

VIII. පාලන අංශය

IX. ගිණුම් අංශය

X. චක්‍රලේඛ අංශය

1.6 දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන / අරමුදල්

අදාළ නොවේ

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

අ) ව්‍යාපෘතියේ නම

ආ) දායක නියෝජිතායතනය

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - රු. මි.

ඈ) ව්‍යාපෘති කාල සීමා

(අ – ඈ සඳහා:) අදාල නොවේ

02 වන පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2025 වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රධාන කාර්යයන්, ජයග්‍රහණ, අභියෝග සහ ඉලක්ක

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව යනු මහා භාණ්ඩාගාර දෙපාර්තමේන්තු අතුරින් රාජ්‍ය අංශය සඳහා අවශ්‍ය ප්‍රශස්ථ සේවක සංඛ්‍යාව නිශ්චය කිරීමට හා පවත්වාගෙන යාමට අදාළව සහ සේවක සංඛ්‍යා හා පාරිශ්‍රමික කළමනාකරණය පිළිබඳ ප්‍රතිමාන සහ ප්‍රමිති සකස් කිරීමට අදාළව ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අනාගත දැක්මට අනුව කටයුතු කරන දෙපාර්තමේන්තුවකි.

2025 මූල්‍ය වර්ෂය තුලදී ද මෙම දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාර ලේකම් හා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරුන්ගේ මාර්ගෝපදේශ යටතේ අදාල කරුණු සම්බන්ධයෙන් කටයුතු කරන ලදී.

2.1 2025 වර්ෂය තුල සිදුකරන ලද ප්‍රධාන කාර්යයන්

i. කාර්යය මණ්ඩල කළමනාකරණය

- 2024.11.25 දිනැති අංක 2412/08 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපිත කරන ලද අමාත්‍යාංශ 24 හි කාර්යභාරය හා ව්‍යුහය සමාලෝචනය කර, සේවා අවශ්‍යතාවය මත පදනම්ව වඩාත් ප්‍රශස්ත කාර්යය මණ්ඩලයක් අනුමත කිරීමට කටයුතු කිරීම.
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ දීර්ඝ කාලයක සිට පැවති කාර්යය මණ්ඩල ගැටළු සමාලෝචනය කර බඳවා ගැනීමේ පරිපාටි අනුමත කරන ලද අතර අන්තර්ග්‍රහණ විධිවිධාන නිකුත් කිරීම මගින් කාර්යය මණ්ඩලය ප්‍රශස්තව කළමනාකරණය කිරීම.

ii. කාර්යය මණ්ඩල සමාලෝචනය

- 2024.12.31 දිනට රාජ්‍ය අංශයේ අනුමත හා තත්‍ය කාර්යය මණ්ඩලය පිළිබඳ තොරතුරු ඇතුලත් සම්පූර්ණ වාර්තාවක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.
- වඩාත් ගුණාත්මක හා ප්‍රශස්ත කාර්යය මණ්ඩලයක් තහවුරු කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ, මධ්‍යම රජයට අයත් රෝහල්, ආයතන, ඒකක, හා වැඩසටහන් පිළිබඳව පළාත් සභාවල සියළුම ආයතනයන්ට ද අදාළ වන සේ ක්ෂේත්‍ර පරීක්ෂා සිදු කරමින් කාර්යය මණ්ඩල සමාලෝචන කටයුතු ආරම්භ කිරීම.

iii. වැටුප් හා දීමනා කළමනාකරණය

- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, අධිකරණ, ත්‍රිවිධ හමුදා, පාර්ලිමේන්තු කාර්යය මණ්ඩලය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යය මණ්ඩලය, ශ්‍රී ජයවර්ධනපුර හා විජය කුමාරතුංග රෝහල් කාර්යය මණ්ඩලය ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක වැටුප් සංශෝධනය කරමින් කළමනාකරණ සේවා චක්‍රලේඛ නිකුත් කිරීම.

- වඩාත් ගුණාත්මක පුහුණු අවස්ථා සහතික කිරීම වෙනුවෙන් පුහුණු වැඩසටහන් වල සම්පත්දායක නිලධාරීන්ට දීමනා ගෙවීම පොදු ක්‍රමවේදයකට සිදු කිරීම සඳහා 10/2025 කළමනාකරණ සේවා චක්‍රලේඛය හා රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල ප්‍රායෝගික පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් අනුයුක්ත කිරීමේදී සිදුකරන ගෙවීම් පිළිබඳ විධිවිධාන ඇතුලත් 11/2025 කළමනාකරණ සේවා චක්‍රලේඛය නිකුත් කිරීම.

එසේම රාජ්‍ය අංශයේ කාර්යය මණ්ඩල කළමනාකරණයට අදාලව ඉදිරිපත් වන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා ගරු මුදල් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කළ යුතු නිරීක්ෂණ නිවැරදිව හා අප්‍රමාදව ලබා දීමට 2025 වර්ෂයේ දී ද දෙපාර්තමේන්තුවට හැකි විය.

2.2 ජයග්‍රහණ

ප්‍රකෘති තත්වයට පත්වෙමින් පැවති ආර්ථිකය තවදුරටත් වර්ධනය කිරීම සඳහා 2025 වර්ෂයේ දී ද රජය විසින් දැඩි මූල්‍ය කළමනාකරණ ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී. ඒ අනුව රාජ්‍ය මූල්‍ය අවකාශය තුල පවතින පීඩාකාරී තත්වයන් හඳුනාගනිමින්, රාජ්‍ය අංශයේ පිරිවැය අවම කරගනිමින් හා උපරිම කාර්යක්ෂමතාවයක් ලබා ගත හැකි වන පරිදි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වන රාජ්‍ය අංශය සඳහා අවශ්‍ය ප්‍රශස්ත සේවක සංඛ්‍යාව නිශ්චය කිරීමට හා පවත්වාගෙන යාමට අදාල කාර්යන් මැනවින් ඉටු කිරීම දෙපාර්තමේන්තුවට යම් අභියෝගයක් විය. එහෙත් රාජ්‍ය අංශයේ පහසුකම් සැපයීමේ වැදගත්කම හඳුනාගෙන අත්‍යාවශ්‍ය අංශයන්හි නව කාර්යය මණ්ඩල අවශ්‍යතා සහ පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතා හඳුනාගෙන ඒ අනුව කටයුතු කිරීමට හැකිවීම හා නව තනතුරු ඇති කිරීමට රාජ්‍ය ආයතන වෙතින් ලැබුණු ඉහළ ඉල්ලීම් ප්‍රමාණය කළමනාකරණය කරමින් 2024 වසරට සාපේක්ෂව සමස්ථ රාජ්‍ය අංශයේ කාර්යය මණ්ඩලය ප්‍රශස්තවම පවත්වා ගැනීමට හැකිවීම දෙපාර්තමේන්තුව ලද සුවිශේෂී ජයග්‍රහණයවේ.

2.3 අභියෝග

රාජකාරි සඳහා කෘතිම බුද්ධිය භාවිතය ඉහල යාම, ක්‍රමවේද සරල කිරීම හා රාජ්‍ය සේවයේ බොහෝ කටයුතු ඉදිරියේදී ඩිජිටල්කරණය වීමේ හැකියාව මත රාජ්‍ය ආයතන වල සාම්ප්‍රදායික රාජකාරි බොහෝ වෙනස්කම් වලට ලක්වීමේ හැකියාව පවතී. නව තාක්ෂණික ක්‍රම හඳුන්වාදීමෙන් සේවකයන්ට නව ක්‍රමවේද සඳහා අනුගත වීමටත් ඒ හරහා ඉදිරියේදී ප්‍රයෝජනවත් නව තනතුරු නිර්මාණය කිරීමටත් සිදු වනු ඇත. ඒ අනුව නව තාක්ෂණය හේතුවෙන් නිර්මාණය වන නව තනතුරු හා සේවක දක්ෂතා අතර ගැලපීම් කිරීම, ආයතන තුල ක්‍රමෝචිත කාර්යය මණ්ඩල වෙනස්කම් හඳුන්වා දීම හා කාර්යය සාධනය වර්ධනය කර ගත හැකි අයුරින් නිසි සැලසුම් හා කළමනාකරණ ක්‍රමවේද හඳුන්වාදීමත් දෙපාර්තමේන්තුව හමුවේ ඇති අභියෝගයයි.

2.4 ඉදිරි ඉලක්ක

1. කාර්යය මණ්ඩලය අනුමත කිරීමේ හා සමාලෝචනයන්ට අදාල ජාත්‍යන්තර නිර්ණායක මත පදනම්ව ශ්‍රී ලංකාවට උචිත නිර්ණායක සකස් කිරීම.
2. රාජ්‍ය සේවය ඩිජිටල්කරණය වීම හා කෘතිම බුද්ධිය භාවිතය ඉහළ යාමත් සමග ඒවාට සමගාමීව කාර්යය මණ්ඩල සම්බන්ධයෙන් කාලීනව සිදුවිය යුතු සංශෝධන හඳුනා ගැනීම.

විමල් එස්.කේ.ලියනගම

අධ්‍යක්ෂ ජනරාල්

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

විමල් එස්. කේ. ලියනගම
අධ්‍යක්ෂ ජනරාල්
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

03 පරිච්ඡේදය - 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025		සටහන	තතය 2025	තතය 2024	
රු.			රු.	රු.	
-	ආදායම් ලැබීම්				
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	ඒසීඒ-1
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		158,364,000	119,437,000	ඒසීඒ-3
-	තැන්පතු		186,312	1,297,400	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		8,175,271	6,007,490	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**166,725,583**	126,741,890	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**166,725,583**	126,741,890	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		**159,593**	20,975	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**166,565,990**	126,720,915	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	ඒසීඒ-2(ii)
103,830,118	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	103,377,527	79,323,701	ඒසීඒ-2(ii)
50,485,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	48,864,166	42,131,393	ඒසීඒ-2(ii)
805,500	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	791,177	785,562	ඒසීඒ-2(ii)
-	පොළී ගෙවීම්	8	-	-	ඒසීඒ-2(ii)
85,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	84,928	28,350	ඒසීඒ-2(ii)
155,205,618	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**153,117,798**	122,269,006	
	මූලධන වියදම්				
5,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	4,279,290	220,950	ඒසීඒ-2(ii)
6,450,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	6,442,410	471,252	ඒසීඒ-2(ii)
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	ඒසීඒ-2(ii)
800,000	හැකියා වර්ධනය	14	645,000	319,000	ඒසීඒ-2(ii)
-	වෙනත් මූලධන වියදම්	15	-	-	ඒසීඒ-2(ii)
12,750,000	**මුළු මූලධන වියදම් (උ)**		**11,366,700**	1,011,202	
	තැන්පතු ගෙවීම්		64,612	1,297,400	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		9,180,385	7,184,066	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		9,244,997	8,481,466	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		173,729,495	131,761,674	
167,955,618	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(7,163,505)	(5,040,759)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(7,163,505)	(5,040,759)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				ඒසීඒ-3
			(7,163,505)	(5,040,759)	

1

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2025 රු.	2024 රු.
<u>මූල්‍ය නොවන වත්කම්</u>			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	49,563,532	43,613,172
<u>මූල්‍ය වත්කම්</u>			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	13,677,088	12,671,974
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**63,240,620**	**56,285,146**
<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		13,555,388	12,671,974
දේපළ පිරියත හා උපකරණ සංචිතය		49,563,532	43,613,172
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
<u>ජංගම වගකීම්</u>			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	121,700	-
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**63,240,620**	**56,285,146**

පිටු අංක **07** සිට **25** දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වු ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක **26** සිට **31** දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණකාධිකාරී	ගණකාධිකාරී	අධ්‍යක්ෂ
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	අධ්‍යක්ෂ
නම :	නම : විමල් එස්.කේ.ලියනගම	නම : ආර්.එම්.ජයන්ත රත්නායක
තනතුර :	තනතුර : අධ්‍යක්ෂ ජනරාල්	දිනය : 2026.02. 18
දිනය : 2026.02. 24	දිනය : 2026.02. 19	

ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ - 01

විමල් එස්. කේ. ලියනගම
අධ්‍යක්ෂ ජනරාල්
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

ආර්. එම්. ජයන්ත රත්නායක
අධ්‍යක්ෂ
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

2

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ජසිජ්-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සටහන	2025 රු.	සංශෝධිත 2024 රු.
<u>**මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u>			
මුළු බදු ලැබීම්		-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර		-	-
ලාභ		-	-
ආදායම් නොවන ලැබීම්		-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්		6,131,186	4,322,970
අග්‍රිම ලැබීම්		158,364,000	119,437,000
අත්තිකාරම් අයකර ගැනීම්		9,280,035	6,142,839
තැන්පතු ලැබීම්		186,312	1,297,400
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)		**173,961,533**	**131,200,209**
<u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u>			
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්		151,938,371	120,901,004
සහනාධාර සහ මාරුකිරීම්		791,177	785,562
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්		11,366,700	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්		460,695	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම		159,593	20,975
අත්තිකාරම් ගෙවීම්		9,180,385	7,184,066
තැන්පතු ගෙවීම්		64,612	1,297,400
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)		**173,961,533**	**130,189,007**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)		-	**1,011,202**
<u>**ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u>			
පොළී		-	-
ලාභාංශ		-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම		-	-
උපණය අයකර ගැනීම්		-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)		-	
<u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u>			
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්		10,721,700	1,011,202
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)		**10,721,700**	**1,011,202**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)		**(10,721,700)**	**(1,011,202)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)		**(10,721,700)**	
<u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u>			
දේශීය ණය ගැනීම්		-	-
විදේශීය ණය ගැනීම්		-	-
ප්‍රදානයන් ලැබීම්		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)		-	-
<u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u>			
දේශීය ණය ආපසු ගෙවීම්		-	-
විදේශීය ණය ආපසු ගෙවීම්		-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)		-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)		-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය		-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය		-	-

3

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.
මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.
දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) මුදල් හා මුදල් සමාන දෑ

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

අදාල නොවේ

රු. ,000

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
-	-	-	-	-	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	127,000	155,206	153,118	99%
ප්‍රාග්ධන	4,000	12,750	11,367	89%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	මැතිවරණ කොමිෂන් සභාව	මැතිවරණ රාජකාරී කාර්යමණ්ඩල වලට ගෙවීම		461	461	100%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2025 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2025 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ	49,564	49,564	-	100%
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ඇමුණුම I

04 පරිච්ඡේදය – කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු , සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රාජ්‍ය ව්‍යාපාර වෙතින් කාර්යමණ්ඩල හා සම්බන්ධව ඉදිරිපත්වූ ඉල්ලීම් වලට ලබාදුන් අවසන් තීරණ සංඛ්‍යාව	√		
රජයේ ව්‍යවස්ථාපිත ආයතන විසින් ඉදිරිපත් කරන ලදුව අනුමත කරන ලද හා සංශෝධනය කරන ලද බඳවා ගැනීමේ පටිපාටි සංඛ්‍යාව	√		
කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2019 පරිදි දේශීය හා විදේශීය අරමුදල් මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා කාර්ය මණ්ඩලය අනුමත කිරීම	√		
අමාත්‍ය මණ්ඩල වෙත ඉදිරිපත් කරන ලද කාර්තුමය කාර්ය මණ්ඩල වාර්තා	√		
නිරීක්ෂණ ලබා දුන් අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව	√		
අවශ්‍යතාවය අනුව චක්‍රලේඛ නිකුත් කිරීම	√		
ඇගයුම හා ප්‍රමාණනය සිදුකළ යුතු කාර්ය සාධන වාර්තා සංඛ්‍යාව සහ අනුමත කළයුතු වැටුප් වර්ධක සංඛ්‍යාව	√		
කාර්යමණ්ඩලයට ලබාදුන් පුහුණු වැඩසටහන් සංඛ්‍යාව		√	
නියමිත දිනට කාර්ය සාධන වාර්තාව , ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කිරීම	√		
2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත ප්‍රකාරව ඉදිරිපත් වූ ඉල්ලීම් සඳහා පිළිතුරු සැපයීමේ සංඛ්‍යාව	√		
නියමිත දිනට වාර්ෂික අයවැය ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම	√		
නියමිත දිනයන්ට ඉදිරිපත් කළ යුතු මාසික ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම	√		
සම්පූර්ණ කළ ප්‍රසම්පාදන ක්‍රියාවලි සංඛ්‍යාව	√		
විගණන විමසුම් වලට අදාළව ඉදිරිපත් කළ පිළිතුරු සංඛ්‍යාව	√		
නියමිත දිනයන්ට ඉදිරිපත් කළ යුතු වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම	√		
නියමිත දිනයන්ට ඉදිරිපත් කළ යුතු අවසන් ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම	√		

05 වන පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	අද දක්වා සාධනයේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
01 : සියළු තන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම	**1:** දරිද්‍රතාව තුරන් කිරීමේ ක්‍රියාවලීන් සඳහා ආයෝජනය කිරීම වේගවත් කිරීමට, දරිද්‍රතාවයෙන් පෙළෙන අය සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී ජාතික, කලාපීය සහ අන්තර්ජාතික මට්ටමේ ප්‍රතිපත්ති රාමු නිර්මාණය කිරීම	ප්‍රතිලාභ ලැබීම සම්බන්ධයෙන් අසාධාරණයට ලක්වන කාන්තාවන්, දිළිඳු පුද්ගලයන් සහ අවදානම් කණ්ඩායම් ඇතුළත් විශේෂිත අංශවල රජයේ සේවා නියුක්තියේ ප්‍රමාණය			√
	2: සියළුම ආකාරයේ දරිද්‍රතාවයන් තුරන් කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් සහ විශ්වාසය තැබිය හැකි ක්‍රමවේද සම්පාදනය කිරීම සඳහා සංවර්ධන සහයෝගීතාව ඇතුළු විවිධ වූ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට රාජ්‍ය අංශයේ මානව සම්පත් ප්‍රමාණවත් පරිදි සංචලනය කිරීම සහතික කිරීම	දිළිඳුකම අවම කිරීමේ වැඩසටහන් සඳහා රජය විසින් වෙන් කරන ලද රාජ්‍ය අංශයේ මානව සම්පත් ප්‍රමාණය හා දරිද්‍රතාව අඩුකිරීමේ වැඩසටහන් සඳහා ඍජුව රජය විසින් වෙන් කරන ලද රාජ්‍ය අංශයේ මානව සම්පත් ප්‍රමාණය			√

අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	අද දක්වා සාධනයේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
03 : නීරෝගී ජීවිත සහතික කර සැම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම	**1:** සෞඛ්‍ය සේවාවන් වෙනුවෙන් වෙන් කරන මුදල් සහ සෞඛ්‍ය කාර්යමණ්ඩල බඳවා ගැනීම සංවර්ධනය කිරීම, පුහුණු කිරීම සහ පවත්වාගෙන යාම සැලකිය යුතු මට්ටමකින් වැඩි කිරීම	සෞඛ්‍ය සේවක ඝණත්වය සහ ව්‍යාප්තිය			√
04 : පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථා සැලසීම	**1:** 2030 වන විට අන්තර්ජාතික සහයෝගය තුළින් ගුණාත්මක වශයෙන් ඉහළ ගුරුවරුන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම	එක් එක් මට්ටම සඳහා ඉගැන්වීම සඳහා අවශ්‍ය වන පූර්ව සේවාස්ථ හෝ සේවාස්ථ, පූර්ව ප්‍රාථමික; ප්‍රාථමික; පහළ ද්විතීයික සහ ඉහළ ද්විතීයික අධ්‍යාපනය යන අංශවල අවම පුහුණුව හෝ ලබා ඇති ගුරුවරුන් ප්‍රමාණය			√
08 : සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම	**1:** 2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයින් ද ඇතුළත්ව සියළුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථාවන් ලබාදීම	ස්ත්‍රී පුරුෂ භාවය, වයස සහ අබාධිත සහිත පුද්ගලයන්ට අදාළව විරැකියා අනුපාතය			√
09 : සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම	**1:** සියළු දෙනාම ඇතුළත් තිරසර වූ කර්මාන්තකරණය ප්‍රවර්ධනය කිරීම, 2030 වන විට ජාතික තත්ත්වයන්ට අනුකූලව රැකියාවන් සැපයීමේ දී කර්මාන්ත අංශයේ දායකත්වය කැපී පෙනෙන ලෙස ඉහළ නැංවීම	සමස්ත සේවා නියුක්තියේ අනුපාතයක් ලෙස රාජ්‍ය නිෂ්පාදන අංශයේ සේවා නියුක්තිය			√

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

(අ) අභිමතාර්ථ සපුරා ගැනීම්

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් සෘජුව ආවරණය වන තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක නොමැති අතර සෘජු ඉලක්ක හා සම්බන්ධිත රාජ්‍ය ආයතන සඳහා පහසුකම්කාරක (Facilitator) ලෙස පමණක් කටයුතු සිදු කරනු ලැබේ. ඒ සම්බන්ධයෙන් පවතින ආයතන සඳහා එම කාර්යයන් ඉටුකිරීමට ප්‍රමාණවත් හා ගුණාත්මක කාර්යය මණ්ඩලයක් ලබා දීම හා අවශ්‍ය අවස්ථාවන්හි දී උපදේශනාත්මක සේවාවන් ලබා දීම මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කර ඇත.

(ආ) අභියෝග

තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා ප්‍රමබ කාර්යයක් ඉටු කරන තනතුරු හා සේවක සංඛ්‍යා නිසි ලෙස කළමනාකරණය කිරීම.

06 වන පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව / (අතිරික්තය)
ජ්‍යෙෂ්ඨ	28	21	07
තෘතියික	2	2	-
ද්විතියික	48	41	07
ප්‍රාථමික	18	16	02
එකතුව	**96**	**80**	**16**

6.2 ආයතනයේ කාර්යසාධනය කෙරෙහි අනුමත සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු මගින් ඇති කරන බලපෑම

(අ) ජ්‍යෙෂ්ඨ මට්ටම

පුරප්පාඩු තනතුරු -	අධ්‍යක්ෂ	01
	නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ	04
	ගණකාධිකාරී	01

නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ තනතුරු වලට අදාළ රාජකාරි, සේවයේ නියුක්ත අධ්‍යක්ෂ, නියෝජ්‍ය හා සහකාර අධ්‍යක්ෂවරුන්ට පවරන ලදුව ඔවුන් තම රාජකාරි වේලාවන්ගෙන් පරිබාහිරව පවා එම රාජකාරීන්හි නියැළෙමින් එම කාර්යයන් ඉටුකළ හෙයින් කාර්යසාධනයට එහි සැලකිය යුතු බලපෑමක් ඇති නොවීය. ඉදිරියේදී අදාල පුරප්පාඩු පිරවීමට අපේක්ෂා කෙරේ.

(ආ) ද්විතියික මට්ටම

පුරප්පාඩු තනතුරු -	සංවර්ධන නිලධාරී	05
	කළමනාකරණ සේවා නිලධාරී	02

පුරප්පාඩු 07 න් පුරප්පාඩු 05ක් රා.පරි.ච. 14/2022 යටතේ නිවාඩු ලබා දීම මත ඇති වී ඇති අතර මේ වන විට සේවයේ නියුතු නිලධාරීන් මගින් පුරප්පාඩු පවතින තනතුරුවල රාජකාරි ඉටුකර ගැනීමට කටයුතු කර ඇත. ඉදිරියේදී අදාල පුරප්පාඩු පිරවීමට අපේක්ෂා කෙරේ.

(ඇ) ප්‍රාථමික මට්ටම

පුරප්පාඩු තනතුරු - කාර්යාල කාර්ය සහායක 02

පුරප්පාඩු 02 න් එක් පුරප්පාඩුක් රා.පරි.ච. 14/2022 යටතේ නිවාඩු ලබා දීම මත ඇති වී ඇති අතර කාර්යාල කාර්ය සහායක පුරප්පාඩු තනතුරු වල රාජකාරි, සේවය කළ කාර්යාල කාර්ය සහායක සේවකයන්ගෙන් ඉටුකර ගැනීමට කටයුතු කරන ලදි. ඉදිරියේදී අදාල පුරප්පාඩු පිරවීමට අපේක්ෂා කෙරේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

දෙපාර්තමේන්තුව තුළ ස්වකීය රාජකාරි ඉටුකිරීම සඳහා සේවකයන්ගේ කුසලතා, දැනුම හා ධනාත්මක ආකල්ප වැඩි දියුණු කිරීම සඳහාත්, ආයතනික අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා කැපවීමක් සහිත ධනාත්මක පෞරුෂත්වයකින් හෙබි තැනැත්තන් දෙපාර්තමේන්තුව තුළ වර්ධනය කරගැනීම සඳහා නිලධාරින් පුහුණු කිරීම ඉතාම වැදගත්වේ.

ඒ අනුව දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට පහත සඳහන් දේශීය හා විදේශීය පුහුණුවීම් ලබා දෙන ලදි.

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව (දින)	සමස්ථ ආයෝජනය (රු. ,000)		වැඩසටහනේ ස්වාභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
1	Public Financial Regulations	2	3	36	-	දේශීය	වෘත්තීය කුසලතා වර්ධනය
2	Course in Human Resources Management	1	5	29	-	දේශීය	වෘත්තීය කුසලතා වර්ධනය
3	Preparation of Spreadsheets using MS Excel	1	1	8	-	දේශීය	වෘත්තීය කුසලතා වර්ධනය
4	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය	4	1	50	-	දේශීය	වෘත්තීය කුසලතා වර්ධනය
5	රාජ්‍ය ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව	3	අවු 1	225	-	දේශීය	වෘත්තීය කුසලතා වර්ධනය
6	විද්‍යාත්මක පිරිමැසුම්දායක සහ ආරක්ෂක රිය පැදවීම	2	1	12	-	දේශීය	වෘත්තීය කුසලතා වර්ධනය
7	Personal File Management	3	3	54	-	දේශීය	වෘත්තීය කුසලතා වර්ධනය

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව (දින)	සමස්ථ ආයෝජනය (රු. ,000)		වැඩසටහනේ ස්වාභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
8	Government Payroll System	2	3	36	-	දේශීය	වෘත්තීය කුසලතා වර්ධනය
9	Stores and Inventory Management	3	3	54	-	දේශීය	වෘත්තීය කුසලතා වර්ධනය
10	කාර්යාල සේවක සේවයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළුව	3	1	20	-	දේශීය	වෘත්තීය කුසලතා වර්ධනය
11	Advanced MS EXCEL	3	2	42	-	දේශීය	වෘත්තීය කුසලතා වර්ධනය
12	රාජ්‍ය ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව	1	අවු 1	80	-	දේශීය	වෘත්තීය කුසලතා වර්ධනය
13	Workshop on New Procurement Guidelines	1	1	8	-	දේශීය	වෘත්තීය කුසලතා වර්ධනය
14	Seminar On Bid Evaluation	4	1	50	-	දේශීය	වෘත්තීය කුසලතා වර්ධනය
15	මුදල් රෙගුලාසි	2	1	15	-	දේශීය	වෘත්තීය කුසලතා වර්ධනය

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව (දින)	සමස්ථ ආයෝජනය (රු. ,000)		වැඩසටහන නේ ස්වාභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
16	රාජ්‍ය අංශයේ රැකියා සංගණනය සඳහා වන ප්‍රධාන සූදානම සහ ආශ්‍රිත ඉදිරිපත්කිරීම්	70	පැය 04	-		දේශීය	වෘත්තීය කුසලතා වර්ධනය
17	Mid-Career Training Programme	01	14 Days		135	විදේශීය	වෘත්තීය කුසලතා වර්ධනය
18	Infrastructure Project Management and PP	01	10 Days		90	විදේශීය	වෘත්තීය කුසලතා වර්ධනය
19	Digitalization under the NCGG- SLIDA – Mou	02	15 Days		214	විදේශීය	වෘත්තීය කුසලතා වර්ධනය
20	Capacity Building Programme on Digital Governance	01	14 Days		130	විදේශීය	වෘත්තීය කුසලතා වර්ධනය
21	Seminar for China and B & R Countries in Co-operation of Governance Capacity	01	24 Days		146	විදේශීය	වෘත්තීය කුසලතා වර්ධනය
22	Poverty Reduction and Rural Revitalization for Indian Ocean Rim	01	14 Days		131	විදේශීය	වෘත්තීය කුසලතා වර්ධනය

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව (දින)	සමස්ථ ආයෝජනය (රු. ,000)		වැඩසටහන නේ ස්වාභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
23	Poverty Reduction and Rural Revitalization for Indian Ocean Rim	01	25 Days		147	විදේශීය	වෘත්තීය කුසලතා වර්ධනය
24	Seminar For Young Diplomats for the DSR of Sri Lanka	03	17 Days		384	විදේශීය	වෘත්තීය කුසලතා වර්ධනය
	Total			**719**	**1377**		

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		

06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අදාළ නොවේ		
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අදාළ නොවේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අදාළ නොවේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාළ නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අදාළ නොවේ		

11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල නොවේ	අතිරේක ප්‍රතිපාදන ලබා ගන්නා ලදී	
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අදාළ නොවේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අදාළ නොවේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාළ නොවේ		

15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාළ නොවේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ (අදාල වන්නේ 10 වන වගන්තිය අනුව වාර්තාව වන අතර එය ඉදිරිපත් කර ඇත.)		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			

18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ		2026 වර්ෂය සඳහා සකස් කරමින් පවතී.
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	2023.11.30 දිනැති රා.ප.ච : 02/2018 (1) 03 ඡේදය අනුව ,වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම තවදුරටත් අවශ්‍ය නොවන බව දන්වා ඇත.	

19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල නොවේ		මේ වන විට පත් කර ඇත.
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No.	TPD/B/DMS/25/FA	ඔබේ අංකය / உமது இல. / Your No.		දිනය / திகதி / Date	2026 මැයි 27 දින

ගණන්දීමේ නිලධාරී
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

ශීර්ෂය 242 - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 242 - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (දෙපාර්තමේන්තුව) 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ , මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාල විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

(අ) මූලධන වත්කම් ඉදිකිරීම, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්

2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 හි 7.8 ඡේදය ප්‍රකාරව, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් වැයකිරීම් යටතේ වන “මූලධන වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්” යටතේ ඇතුළත් කළ යුත්තේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඇතුලත් වත්කම් අත්පත් කර ගැනීමට දරන වියදම පමණි. කෙසේ වුවද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව, සමාලෝචිත වර්ෂයේ වත්කම් අත්පත්කර ගැනීමේ වටිනාකම රු. 6,442,410 ක් වුවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ මුදල් වැය කිරීම් යටතේ මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් රු.10,721,700 ක් ලෙස දක්වා තිබීමෙන් ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය සහ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 4,279,290 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරු කිරීම, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්

ඉහත (අ) හි සඳහන් මාර්ගෝපදේශයේ 7.9 ඡේදය ප්‍රකාරව, මූලධන වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් හැර මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරු කිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්, මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුදල් වැය කිරීම් යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතුය.

සමාලෝචිත වර්ෂයේ මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම, මූලධන මාරු කිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්වල එකතුව රු.4,924,290 ක් වුවත්, එය රු.11,366,700 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ වැය කිරීම් ලෙස දක්වා තිබීමෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය රු. 6,442,410 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 හි 7.10 ඡේදය ප්‍රකාරව, 2024 වර්ෂය සඳහා දක්වන ලද සන්සන්දනාත්මක සංඛ්‍යා එම මාර්ගෝපදේශයේ 7.8 හා 7.9 අනුව සංශෝධනය විය යුතු වේ. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයට අනුව, මූලධන වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීමේ වටිනාකම රු.471,252 ක් හා මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම, මූලධන මාරු කිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම් රු.539,950 ක් වූ අතර එම වටිනාකම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි මූලධන වත්කම් පුනරුත්ථාපනය

හා වැඩි දියුණු කිරීම, මූලධන මාරු කිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම් සහ මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් ලෙස වෙන වෙනම දැක්විය යුතු වුවත්, මූලධන වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් යටතේ රු.1,011,202 ක මුළු එකතුවක් ලෙස දක්වා තිබුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

සමාලෝචිත වර්ෂය තුළදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය වෙත පවරා දුන් රු.101,000 ක් වටිනා පරිගණකය (I Pad යන්ත්‍රය) හා රු.10,050 ක වටිනාකමට විකුණා තිබූ ශීතකරණය යන මූල්‍ය නොවන වත්කම්, පවරා ගැනීම හා මිලදී ගැනීම සිදු කල අවස්ථාවලදී ගිණුම්ගත නොකිරීමෙන් මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි (ACA – 06) සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය හා අපහරණ වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. එම නිසා දෙපාර්තමේන්තුවේ මූල්‍ය නොවන වත්කම් නිවැරදිව හෙළිදරව් කර නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

3.1.1 අවශ්‍යතාවයට වඩා වැඩියෙන් ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සලසා ගැනීම

(අ) අංක 242-1-1-0-2003 - වාහන පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම වැය විෂයය සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු.1,200,000 න් රු.1,075,000 ක් ඉතිරිවී තිබූ අතර එම ඉතිරිය ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 90 ක් විය.

(ආ) වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයයකට ප්‍රතිපාදන මාරු කල පසුව ද අංක 242-1-1-0-1409-139 දරන වැය විෂයයට අදාලව ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 37 ක් එනම් රු. 92,727 ක් හා අංක 242-1-1-0-1409-138 දරන වැය විෂයයට අදාලව ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 54 ක් එනම් රු.270,604 ක් ඉතිරි වී තිබුණි.

3.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

3.3.1 කාර්යය සාධන වාර්තාව ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබු අතර, එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කිරීමට මාසයකට වැඩි කාලයක් ප්‍රමාද වී තිබුණි.

3.4 මූල්‍ය ප්‍රකාශන ආකෘතීන්වල පැවති අඩු පාඩු

(අ) ඒසීඒ - 2(i), ඒසීඒ - 2(ii), ඒසීඒ - 2(iii) යන ප්‍රකාශන වල පහත වැය විෂයයන් නිවැරදිව බෙදා වෙන් නොකර එකතුවක් ලෙස දක්වා තිබුණු අතර, එම වැය විෂයයන්ට අදාලව අයවැයගත ඇස්තමේන්තු ප්‍රතිපාදන, පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන, මු.රෙ. 66/69 මාරු කිරීම්, මුළු ශුද්ධ ප්‍රතිපාදන, වියදම, මුදල් පොතට අනුව වියදම, ඉතිරිය හෝ ඉක්මවීම, ඉතිරිය හෝ ඉක්මවීමට හේතු, මූලික ඇස්තමේන්තු වෙනස් වීමට හේතු වෙන් වෙන්ව දක්වා නොතිබුණි.

වැය විෂය අංකය	විස්තරය
242-1-1-0-1202-002	ඉන්ධන දීමනාව
242-1-1-0-1202-009	සංචිත වාහන සඳහා ඉන්ධන
242-1-1-0-1409-138	යන්ත්‍ර හා කාර්යාල උපකරණ සේවා ගිවිසුම්
242-1-1-0-1409-139	වාහන රක්ෂණය
242-1-1-0-1409-140	විවිධ සේවා ගිවිසුම්

(ආ) 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 හි 3.4 ඡේදය අනුව, ඒසීඒ 2(ii) ආකෘතියෙහි දැක්වෙන මුළු ශුද්ධ ප්‍රතිපාදන හා තත්‍ය වියදම අතර වෙනසට හේතු දැක්විය යුතු අතර, වැය විෂයයේ ශුද්ධ ප්‍රතිපාදන ප්‍රමාණයෙන් සියයට 5 හෝ රු.10,000 යන දෙකෙන් කවර හෝ වැඩි මුදලකට වඩා අඩු වන්නේ නම් පමණක් වෙනසට හේතු ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. ඒ අනුව, වැය විෂයයන් 04 කට අදාලව මුළු ශුද්ධ ප්‍රතිපාදන තත්‍ය වියදම අතර වෙනසට හේතු දක්වා නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන හානි හා පාඩු ලේඛණය අනුව, 2025 වර්ෂය තුල දී සිදු වූ වාහන අනතුරු 02 සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනයේ පාඩු

හා අත්හැරීම් පිලිබඳ ප්‍රකාශනයේ (ඇමුණුම i) දක්වා නොතිබුණු අතර ඊට හේතුව ලෙස, අදාල වාහන සඳහා අලාභයේ මූල්‍ය වටිනාකම තක්සේරු කර නොතිබීම නිසා පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයට ඇතුලත් නොකල බව දක්වා තිබුණි. තවද, මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව, අලාභහානිය සිදු වූ දිනයේ සිට මාස 03 ක් ඇතුලත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවත්, 2025 සැප්තැම්බර් හා ඔක්තෝබර් යන මාස වල සිදු වූ ඉහත අනතුරු 02 සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල දින තෙක් මාස 04කට අධික කාලයක් ගෙන තිබුණු අතර අලාභයේ මූල්‍ය වටිනාකම ඒ වන විටත් තක්සේරු කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරය ඉටු කිරීමේ ප්‍රගතිය

(අ) දත්ත පද්ධතිය පවත්වාගෙන යාම

භාණ්ඩාගාර ලේකම් සහ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක DMS/E/1/99 හා 1999 මැයි 05 දිනැති චක්‍රලේඛය අනුව පිහිටුවන ලද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රථම පියවර වශයෙන්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව තුළ පොදු දත්ත මූලාශ්‍රයන් පිහිටුවීමට හා විවිධ නියෝජිත ආයතන අතර අපිළිවෙලට විසිර පවත්නා දත්ත, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව යටතේ ඒකාබද්ධ කොට යාවත්කාලීන කොට කේන්ද්‍රගත කිරීමට යෝජනා වී තිබූ අතර, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ලෙසට රාජ්‍ය අංශයේ සහ පළාත් රාජ්‍ය සේවයේ සේවක පිරිස පිළිබඳ තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය හඳුනාගෙන තිබුණි. ඒ අනුව, මහාභාණ්ඩාගාරය සඳහා දැනට ක්‍රියාත්මක ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතියේ Integrated Treasury Management Information System (ITMIS) විශේෂිත මානව සම්පත් මොඩියුලය, දත්ත පද්ධතිය ලෙස භාවිතා කිරීමට ආරම්භ කර තිබුණ ද, එමගින් මධ්‍යම රජයේ ආයතන පමණක් ආවරණය වන බැවින් පළාත් සභා සහ රාජ්‍ය ව්‍යවසායන්හි අනුමත කාර්ය මණ්ඩලය සම්බන්ධව තොරතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ එක්ව Cadre Management Information System (CMIS) නමින් පරිගණක දත්ත පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා කටයුතු ආරම්භ කර තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසාන වන තෙක් ඉහත දත්ත පද්ධතීන් සම්පූර්ණ කර නොතිබුණි. දෙපාර්තමේන්තුව පිහිටුවා සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 26 ක පමණ කාලයක් ගතවී තිබුණ ද, දත්ත පද්ධතියක් නිර්මාණය කර අදාල යාවත්කාලීන තොරතුරු පවත්වාගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) රජය සතු ව්‍යවසායන් සඳහා වන කාර්ය මණ්ඩලය හා එම තනතුරු සඳහා වූ අදාල බඳවා ගැනීමේ පටිපාටින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කිරීමෙන් පසුව එම අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් විධිවිධාන අනුව බඳවා ගැනීම් සිදු කල යුතු වුවත්, 2023 දෙසැම්බර් මස 15 දිනට සිදු කල පරික්ෂාවේදී රජය සතු ව්‍යවසායන් 81 ක් සඳහා බඳවා ගැනීමේ පටිපාටි අනුමත කරවා ගැනීමකින් තොරව කාර්ය මණ්ඩල බඳවාගෙන තිබූ බව නිරීක්ෂණය වුණි. 2025 දෙසැම්බර් 31 වන විට වසර 2 ක් ගත වී තිබුණ ද, ඉහත සඳහන් රාජ්‍ය ව්‍යවසායන් අතුරින් ව්‍යවසායන් 04 ක් පමණක් බඳවා ගැනීමේ පටිපාටි අනුමත කර ගෙන තිබූ බවත්, ආයතන 42 ක UPL 1, UPL 2, සහ UPL 3 යන වැටුප් කේත දරන තනතුරු සඳහා

පමණක් බඳවා ගැනීමේ පටිපාටි සකස් කර තිබූ නමුත් අනෙක් තනතුරු සම්බන්ධයෙන් බඳවා ගැනීමේ පටිපාටි සකස් කර නොමැති බවත්, නිරීක්ෂණය විය. එසේම, තවත් රාජ්‍ය ව්‍යවසායන් 19 ක් සඳහා බඳවා ගැනීමේ පටිපාටි සකස් කර නොමැති බවද විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව තහවුරු වුණි.

(ඇ) බඳවා ගැනීමේ පටිපාටි අනුමත කරගත යුතු රාජ්‍ය ව්‍යවසායන් විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් කර තිබුණු ඇතැම් ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීමට සැලකිය යුතු කාලයක් ගතවී තිබුණු අතර, නියැදි පරීක්ෂණයේදී 2025 දෙසැම්බර් 31 දින වන තුරුත් අනුමැතිය ලබාදී නොතිබුණු ආයතන 22 ක් විය. තවද, එම ඉදිරිපත් කර තිබූ බඳවාගැනීමේ පටිපාටි වලට අදාලව සිදුකල යුතු සංශෝධනයන් සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අදාල ආයතන වෙත දැන්වීමට සැලකිය යුතු කාල ප්‍රමාදයක් ගෙන තිබුණු බවද නිරීක්ෂණය විය. එනම් වසර 01 සිට වසර 04 ට අධික කාලයක් ගෙන තිබුණි. තවද, රාජ්‍ය ව්‍යවසායන් විසින් ඉදිරිපත් කරන ලද බඳවාගැනීමේ පටිපාටි අනුමත කිරීමටද වසර 01 සිට වසර 04 ට අධික කාලයක් ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

4.2 වත්කම් කළමනාකරණය

2023 අගෝස්තු 24 දිනැති අංක 06/2023 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව, සියළුම රජයේ ආයතනවල පවතින වාහන සඳහා වන මොඩියුලය 2023 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක කර තිබුණි. එම චක්‍රලේඛයේ 4 (iv) ඡේදය ප්‍රකාරව, වාහනවලට අදාල මුලික තොරතුරු වාර්තා කිරීමෙන් අනතුරුව, අනෙකුත් දත්ත ක්ෂේත්‍ර සම්පූර්ණ කල යුතු වුවත්, 2025 දෙසැම්බර් 31 දින වන විට, දෙපාර්තමේන්තුව සතුව තිබූ වාහන 11 කට අදාල තක්සේරු වටිනාකම, රක්ෂණ, අනතුරු, නඩත්තු, ඉන්ධන කාර්යක්ෂමතාවය, වාහන ආයතන අතර මාරු කිරීම් හා අපහරණ තොරතුරු මාර්ගගත මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතියේ (NFAMS) ඇතුලත් කර නොතිබුණි.

4.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

(අ) මුදල් රෙගුලාසි 880 (i) ප්‍රකාරව, රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදාහැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම් යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාල වවුචර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටුකරන බවට 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට අනුකූලව ඇප තැබිය යුතු වේ. දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව, ඇප තැබිය යුතු නිලධාරින් 17 දෙනෙකු විසින් 2025 දෙසැම්බර් 31 දින වන විටත් ඇප තැබීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 881 (i) ප්‍රකාරව, ඇප තැබිය යුතු තනතුරකට නිලධාරියකු පත්කිරීමේදී එකී නිලධාරියා විසින් එම තනතුරට පත්කළ දින සිට දෙමසක් ඇතුලත ඇප තැබීමක් කළ යුතු වේ. එමෙන්ම, මුදල් රෙගුලාසි 881(ii) ප්‍රකාරව, ඇප තැබීමට අවශ්‍ය සිය යටත් නිලධාරීන් නියමිත කාල සීමාව ඇතුළත එසේ ක්‍රියා කරන බවට ආයතන ප්‍රධානින් විසින් වග බලා ගත යුතු වේ. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරින් 16 දෙනෙකු විසින් ඇප තැබීමේ තනතුරට පත් වී 2025 දෙසැම්බර් 31 දින වන විටත් මාස 04 සිට මාස 91 ක කාලයක් ගත වී තිබුණත්, ඉහත ප්‍රකාරව කටයුතු කිරීමට එම නිලධාරින් අපොහොසත් වී තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 883 ප්‍රකාරව, ඇප තැබීමට අවශ්‍ය තනතුරුවලට කර ඇති සියලුම අළුත් පත්වීම් සහ ඇප තබා ඇති නිලධාරීන් පිළිබඳ මාරු කිරීම්, ඉල්ලා අස් වීම්, සේවයෙන් පහ කිරීම්, මිය යෑම් යනාදිය සම්බන්ධයෙන් සෑම මාසයක් පාසාම විගණකාධිපතිවරයා දැනුවත් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 891 (ii) ප්‍රකාරව, ඇප තැන්පත් ලේඛනය නිතිපතා පරීක්ෂා කර බලා වගකිව යුතු නිලධාරිගේ කෙටි අත්සන යෙදිය යුතු වුවත්, කාර්යාලයේ ඇප ලේඛනයෙහි එලෙස කෙටිසන් යොදා නොමැති බව නිරීක්ෂණය විය.

(ඉ) මුදල් රෙගුලාසි 892 ප්‍රකාරව, ඇප තැබීමට අවශ්‍ය සියළුම නිලධාරින්ගේ නම් අකාරාදි ක්‍රමයට පිළියෙල කර තුන් වන ලිත් වර්ෂය අවසානයට පසුව යෙදෙන පෙබරවාරි 15 දිනට පෙර සංශෝධිත වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එසේ ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

5. අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

2025 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය, තත්‍ය කාර්ය මණ්ඩලය හා පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත කාර්ය මණ්ඩලය	තත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	28	21	07
තෘතියික මට්ටම	02	02	-
ද්විතීයික මට්ටම	48	46	02
ප්‍රාථමික මට්ටම	18	17	01
එකතුව	**96**	**86**	**10**

දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 96 ක් වූ අතර, ඉන් තනතුරු 10 ක් පුරප්පාඩුව පැවති අතර ඉන් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය කෙරෙහි සෘජුවම බලපානු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 07 ක් සහ ද්විතීයික මට්ටමේ තනතුරු 02 ක් ද, විය. ඒ අනුව, පුරප්පාඩු පිරවීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරවා ගැනීමට දෙපාර්තමේන්තුව විසින් 2025 වර්ෂය තුළදී කටයුතු කර නොතිබුණි.

එස්. රත්නවීර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට